**රාජකීය විද්‍යාලය - කොළඹ 07**

**I වාර පරීක්ෂණය - 2008**

**පුරවැසි අධ්‍යාපනය හා ප්‍රජා පාලනය - 10 ශ්‍රේණිය**

---

**'අ' කොටසේ සියලු ප්‍රශ්න වලටත් 'ආ' කොටසින් ප්‍රශ්න 4 කටත් පිළිතුරු ලියන්න.**

## 'අ' කොටස

**නිවැරදි පිළිතුර තෝරන්න.**

1. නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ නිජබිම වන්නේ,
(ඇතන්ස් - රෝමය - ග්‍රීසිය)

2. ග්‍රීසියේ පෞර රාජ්‍යයක් වන්නේ,
(ස්පාඤ්ඤය - ස්පාටා - ස්විඩනය)

3. ජනතාවගේ නියෝජිතයන් මඟින් සිදුවන පාලනය හඳුන්වන්නේ,
(ඒකාධිපති පාලනය - නියෝජන ප්‍රජාතන්ත්‍ර පාලනය - සමාජවාදී පාලනය)

4. ගම්වාසින්ගේ බහුතර කැමැත්තෙන් පත්වන ගම් නායකයා
(රජතුමා - ගමික - රාජන්)

5. සෘජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම තුලින් ප්‍රාරම්භනය ක්‍රියාත්මක වන රටකට ඇතුලත් වන්නේ,
(ස්වීඩනය - ස්විස්ටර්ලන්තය - සිඩ්නි)

6. ලෝකයේ දේශපාලන පක්ෂ එකක් පවතින රටකට නිදසුනකි.
(ලංකාව - ඉන්දියාව - කොරියාව)

7. මැතිවරණ කොට්ඨාශ බෙදා වෙන්කිරීමේදී යොදගනු ලැබූ ප්‍රධාන සාධකයක් වන්නේ,
(රටක පවත්නා ජනගහනය - ජාතීන් අනුව වර්ග කිරීම - පරිපාලන දිස්ත්‍රික් බෙදීම්)

8. බාහිර බාධක වලින් තොරව පුද්ගලයාට සිය පෞද්ගලිකත්‍වය වර්ධනය කර ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථාව නිදහස යන්නට ප්‍රකාශ කර ඇත්තේ,
(ජේ. ලැස්කි - පී.ඩී.එච්. කෝල් - ජෝන් ලොක්)

9. සමස්ත මානව වර්ගයාටම භුක්ති විදිය හැක අයිතිවාසිකම් සටහන් වන්නේ
(මානව සංවර්ධන දර්ශකය - මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශය - එක්සත් ජාතීන්ගේ සංවිධානය)

10. අලිඛිත ව්‍යවස්ථාවක් ඇති රටකට නිදසුනක් වන්නේ,
(ඊශ්‍රායලය - ලංකාව - ඉන්දියාව)

11. රටක පරමාධිපති බලය හිමිව ඇත්තේ
(අධිකරණයටයි - ව්‍යවස්ථාදයකයමය - මහජනතාවටයි)

12. පුද්ගල මතවාදයන්, මෙන්ම විශ්වාසයත් ඒකීය වශයෙන් ප්‍රකාශයට පත්වීම හඳුන්වන්නේ,
(මහජනමතය ලෙසය - රාජ්‍ය මතය ලෙසය - නිදහස් ජනමාධ්‍ය ලෙයසි)

13. නීතියට අනුව රටක් පාලනය වීම
(නීතියේ ආධිපත්‍යය - ස්වාධිපත්‍ය - අධිකරණ අයිතිවාසිකම්) වේ.

14. ප්‍රංශ ජනාධිපතිගේ නිල කාලය
(අවුරුදු 4 - අවුරුදු 2 - අවුරුදු 5)

15. ඔම්බුඩ්ස්මන් යනුවෙන් හඳුන්වන්නේ,
(පාර්ලිමේන්තු ලේකම් - පාර්ලිමේන්තු කොමසාරිස් - පාර්ලිමේන්තු නීතිපති)

**පහත සඳහන් වාක්‍ය විස්තර නිවැරදි නම් "√" ලකුණද වැරදි නම් "X" ලකුණද යොදන්න.**

16. පැරණි ලිබරල් වාදයේ ආර්ථික දර්ශණය රාජ්‍ය නිර්බාධ වාදයයි. ( )

17. ජනාධිපති විධායකය ව්‍යවස්ථාදයකයට පරිබාහිර උපදේශක මණ්ඩලයකින් උපදෙස් ලබයි. ( )

18. ඒකීය රාජ්‍යයක සෑම පාලන කටයුත්තක් මධ්‍යම ආණ්ඩුවෙන් සිදු නොකරයි. ( )

19. අමෙරිකානු ව්‍යවස්ථාවේ යම් සංශෝදනයක් ඇති කිරීමට නම් ප්‍රාන්ත රාජ්‍ය වල $2/3$ ක අනුමැතිය අවශ්‍ය නොවේ. ( )

20. ලංකාවේ වර්තමානය තුල දේශපාලනික වශයෙන් වෙන්කර ඇති පරිපාලන දිස්ත්‍රික්ක සංඛ්‍යාව 22 කි. ( )

(ලකුණු 40)

## 'ආ' කොටස

ප්‍රශ්ණ 4 පිළිතුරු සපයන්න.

(1) i. ප්‍රජාතන්ත්‍රවාදය යනු කුමක්ද? (ල 04)

ii. ප්‍රජාතන්ත්‍රවාදය යන්නට නිර්වචන 2ක් ලියන්න. (ල 04)

iii. ඍජු ප්‍රජාතන්ත්‍රවාදී උපක්‍රම 4ක් ලියා ඉන් එකක් පිළිබඳ විස්තරයක් ලියන්න. (ල 07)

(ලකුණු 15)

(2) i. මිනිසා ලබන නිදහස යනු කුමක්දැයි නිර්වචනය මගින් පැහැදිලි කරන්න. (ල 04)

ii. මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයට අනුව සමාජයට ප්‍රකාශ කර ඇති සිවිල් හා දේශපාලනික අයිතිවාසිකම් 4ක් බැගින් ලියන්න. (ල 04)

iii. අද භුක්ති විඳින, අතීතයේ අයිතිවාසිකම් භුක්තිවිඳීමට ඇතිකළ විප්ලව 4ක් අදල වර්ෂ සමඟ නම් කරන්න. (ල 07)

(ලකුණු 15)

(3) i. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක ඇතුලත් වූ මූලික අංග 3ක් ලියන්න. (ල 04)

ii. "ප්‍රජාතන්ත්‍රවාදී රටක සාකච්ඡාව ජීව රුධිරයයි" උදහරණ 3ක් මගින් පැහැදිලි කරන්න.(ල 04)

iii. ප්‍රජාතන්ත්‍රවාදය සාර්ථක වීමට අවශ්‍ය සාධක 4ක් ලියන්න. (ල 07)

(ලකුණු 15)

(4) i. රාජ්‍ය හා ආණ්ඩු අතර වෙනස්කම් පැහැදිලි කරන්න. (ල 04)

ii. ජාතික රාජ්‍ය නිර්මාණයේදි බලපෑ හේතු 4ක් ලියන්න. (ල 04)

iii. බ්‍රිතාන්‍ය වැනි සුවිශේෂී ජාතික රාජ්‍යයක් නැගී සිටීමට හේතුවූ කරුණු 2ක් දක්වා ඉන් 1ක් විස්තර කරන්න. (ල 07)

(ලකුණු 15)

(5) i. ජනමත විචාරණය යනු කුමක්ද? (ල 04)

ii. ජනාධිපති ආණ්ඩුක්‍රමයක විශේෂ ලක්ෂණ 3ක් දක්වන්න. (ල 04)

iii. වර්තමාන ලංකාවේ විධායක ජනාධිපති බලතල 4ක් ලියන්න. (ල 07)

(ලකුණු 15)

(6) i. බලය බෙදහැරීම කෙටියෙන් පැහැදිලි කරන්න. (ල 04)

ii. බලය විමධ්‍යගතකරණය හා බලය බෙදාහැරීම සංකල්පයන්හි මූලික වෙනස්කම් ලියන්න? (ල 04)

iii. ස්විස්ටර්ලන්තයේ කැන්ටන් හෙවත් ප්‍රාදේශීය පාලන ඒකක වෙත බෙද ඇති බලතල 4ක් ලියන්න. (ල 07)

(ලකුණු 15)